... අමාත්‍යාංශය පිරිවෙන් අධ්‍යාපන ශාඛාව

දිස්ත්‍රික් තරඟ වටය

ත්‍රිපිටක ධර්මඥාන තරඟය | ප්‍රාථමික අංශය | කාලය පැය 03 යි.

* ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

## I කොටස

01. කෙටි පිළිතුරු සපයන්න.

i. ආචාර්යයන් වහන්සේ නමක් වීමට අවශ්‍ය ප්‍රධාන ගුණ ධර්ම හතර නම් කරන්න.

ii. පටාචාරාව මුහුණදුන් ව්‍යසන කිහිපයකි. ඒවා මොනවාද ?

iii. හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමියන්ගේ ශාස්ත්‍රීය සේවාව දක්වෙන ග්‍රන්ථ දෙකක් හා පුවත්පත් දෙකක් නම් කරන්න.

iv. අනේපිඬු සිටුතුමාගේ දූ දරුවන් සිව්දෙනා නම් කරන්න.

v. බුද්ධ සසුනෙහි විනය නීති පැනවීමට හේතු වූ ආසවට්ඨානීය ධර්ම මොනවාද ?

vi. විනය නීති පැනවීමේ අපේක්ෂා හතරක් නම් කරන්න.

vii. සංඝයා වහන්සේලා උපෝසථාගාරයට රැස්වීමට පෙර කළ යුතු කාර්යයන් මොනවා ද ?

viii. ගිහි කුල පුත්‍රයෙකුට මෙලොව හිත සුව පිණිස හේතුවන කරුණු මොනවාද ?

ix. විරති චෛතසික නම් කරන්න.

x. සතර සෘද්ධිපාද නම් කරන්න.

xi. සසර ගත සත්වයා තුළ පවත්නා ආසව ධර්ම මොනවාද ?

xii. අරූපාවචර ධ්‍යාන ලැබිය හැකි සතර ආරුප්ප නම් කරන්න.

xiii. අසාධාරණ ඤාණ අතුරෙන් හතරක් නම් කරන්න.

xiv. බුද්ධ දහමට අනුව අනුගමනය කළ යුතු බලි මොනවාද ?

xv. හේතු ප්‍රත්‍යය සමවායෙන් හටගත් සංස්කාර ධර්මවලට අයත් පොදු ලක්ෂණ මොනවාද ?

ලකුණු 4 x 15 =

## II කොටස

02. "යාවජීවම්පි චෙ බාලො" ගාථාව සම්පූර්ණ කොට අර්ථය දක්වා නිදාන කථාද ඇතුළත් වනසේ ධර්ම විස්තරයක් කරන්න.

03. ප්‍රථම ධර්ම සංගායනාව පිළිබඳ ආසන්න හේතු දුරස්ථ හේතු ඇතුළත් වන සේ විස්තරයක් කරන්න.

04. සිඟාලෝවාද සූත්‍රයෙහි දක්වෙන පරිදි මිතුරු වෙසින් පෙනී සිටින මිත්‍ර ප්‍රතිරූපකයන් පිළිබඳව විස්තරයක් කරන්න.

05. බුදුරජාණන් වහන්සේ දම්සක් පැවතුම් සූත්‍රයෙහි ඉදිරිපත් කළ මැදුම් පිළිවෙත පිළිබඳව විස්තර කරන්න.

(ලකුණු 10 x 4 = 40)